ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය- 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ (“මණ්ඩලය”) 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මණ්ඩලය මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලය මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි මණ්ඩලයේ ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශණ විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

- හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- මණ්ඩලය සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- මණ්ඩලය සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 02 හි 28 හා 34 ඡේද ප්‍රකාරව යම් තොගයක පිරිවැය නැවත අය කර ගත නොහැකි තත්ත්වයට පත්ව ඇත්නම් එම තොගවල පිරිවැය, ශුද්ධ උපලබ්ධි අගය දක්වා ලියා හැරිය යුතු අතර ලියාහරින ලද ප්‍රමාණය වර්ෂයේ වියදමක් සේ සැලකිය යුතුය. එසේ වුවද සමාලෝචිත වර්ෂයේ භෞතික තොග සත්‍යාපනයේදී හඳුනාගන්නා ලද රු.877,957 ක් වටිනා හානි වූ තොගයක් සම්බන්ධයෙන් උක්ත ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	හානිවූ තොග සම්බන්ධව ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කරනු ලැබේ.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව තොගයක පිරිවැය නැවත අයකර ගත නොහැකි තත්වයට පත්ව ඇත්නම් එහි පිරිවැය ශුද්ධ උපලබ්ධි අගය දක්වා ලියා හැර ලියා හරින ලද ප්‍රමාණය වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කළ යුතුය.
(ආ)	පූර්ව කාලපරිච්ඡේද දෝෂ නිවැරදි කිරිමේදි ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 08 හි 42 ඡේදය ප්‍රකාරව වරද සිදු වූ කාලපරිච්ඡේදය සඳහා ඉදිරිපත් කර ඇති සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කළ යුතු වුවත් මණ්ඩලය විසින් පූර්ව කාලපරිච්ඡේදයට අයත් එකතුව රු.70,721,246 ක් වූ වැරදි 92 ක් ඇතුළත් කර සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කර නොතිබූ අතර ප්‍රමිතියේ 49 වන ඡේදය	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 08 ප්‍රකාරව පෙර කාලපරිච්ඡේද දෝශ නිවැරදි කිරීමේදී සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමට 2025 වර්ෂයේ සිට කටයුතු කරනු ලැබේ.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව පූර්ව කාලපරිච්ඡේද දෝෂ නිවැරදි කිරීමේදී සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කළ යුතු අතර ඒ සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය.

	ප්‍රකාරව ඒ සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර ද නොතිබුණි.		
(ඇ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 50 හා 51 ඡේද ප්‍රකාරව භාවිතයට ගනු ලබන වත්කම්වල ප්‍රයෝජනවත් ජීවකාලය වාර්ෂිකව සමාලෝචනය කර වටිනාකම ඇස්තමේන්තු කර ගිණුම්ගත කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසන් වන විට සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද එහෙත් තවමත් භාවිතා කරන පිරිවැය රු.181,980,913 ක් වූ වත්කම් සම්බන්ධව එසේ වටිනාකම ඇස්තමේන්තුකර ගිණුම්ගත කර නොතිබුණි.	ක්ෂය කර අවසන් දේපළ සඳහා විෂය දැනුම සහිත මණ්ඩලයක හා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත කටයුතු කරනු ලැබේ.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව භාවිතයට ගනු ලබන වත්කම්වල ප්‍රයෝජනවත් ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය කර වටිනාකම ඇස්තමේන්තු කර ගිණුම් ගත කළ යුතුය.
(ඈ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19 හි 76 ඡේදය ප්‍රකාරව රු.56,442,498 ක් වූ පාරිතෝෂික වෙන්කිරීම්වලට අදාළ පශ්චාත් සේවා ප්‍රතිලාභ බැඳියාව සහ සම්බන්ධ ප්‍රවර්ථන සේවා පිරිවැයේ වර්තමාන අගය ගිණුම්වල දැක්වීමට කටයුතු කර නොතිබුණි.	එම සේවා සපයනු ලබන ආයතනයක් සම්බන්ධ කරගෙන ඉදිරියේදී මෙම කාර්ය සිදුකර ගැනීමට අධ්‍යක්‍ෂ මණ්ඩල නිර්දේශයක් ලබාගෙන කටයුතු කරනු ලැබේ.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව පාරිතෝෂික වෙන් කිරීමේදී පශ්චාත් සේවා ප්‍රතිලාභ බැඳියාව සහසම්බන්ධ ප්‍රවර්තන සේවා පිරිවැයේ වර්තමාන අගය ගිණුම්වල දැක්විය යුතුය.
(ඉ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 24 හි 17 ඡේදය ප්‍රකාරව සම්බන්ධිත පාර්ශව වෙත ගෙවන ලද පාරිශ්‍රමික හා අනෙකුත් දීමනා පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවත් ආයතනයේ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ එම තොරතුරු හෝ සම්බන්ධිත පාර්ශව සමඟ ගණුදෙනු සිදු නොවුණු බවට මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි.	මූල්‍ය ප්‍රකාශන වල අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය වෙත ගෙවන ලද පාරිශ්‍රමික හා අනෙකුත් දීමනා පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මණ්ඩලයේ SAP පද්ධතියෙහි පැවති දෝෂ නිරාකරණය කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ගෙවිය යුතු රු.550,000 ක් ගිණුම් ගතකර නොතිබුණි.	2025 ගිණුම් තුල නිවැරදි කිරීමට ක්‍රියාකර ඇත.	වර්ෂයට අදාළ සියළු වියදම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.

(ආ)	සමාලෝචිත වර්ෂයේ රු.12,333,493 ක් වූ (එකතු කළ අගය මත බදු රහිත) දේශීය හා විදේශීය ඇණවුම් 53 ක විකුණුම් වලට අදාළ රු.770,745 ක් වූ එකතු කළ අගය මත බදු, විකුණුම් ආදායමට ගෙන තිබීමෙන් විකුණුම් ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	ඇණවුම් 53 ට අදාලව VAT බිල්පත් නිකුත් කර ඇති බැවින් VAT වටිනාකම පෙර වර්ෂ ගැලපීම් වශයෙන් 2025 වර්ෂයේදී නිවැරදි කරනු ලැබේ.	අය වූ එකතු කල අගය මත බදු පාලන ගිණුමක් මඟින් ගිණුම්ගත කළ යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂයේ රු.4,898,485 ක් වූ ලක්සල පරිශ්‍රයන්හි විකුණුම්වලට අදාළ තොගයේ වටිනාකම අවසාන තොගයෙන් අඩු කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වත්කම් හා ලාභය සමාන ප්‍රමාණයකින් වැඩියෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේ නිවැරදි කරනු ලැබේ.	විකුණුම්වලට අදාළ තොග වටිනාකම අවසාන තොගයෙන් අඩු කර අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට කටයුතු කළ යුතුය.
(ඈ)	SAP පද්ධතිය අක්‍රිය වීමත් සමඟ 2024 මාර්තු මස සිට සිදුකරන ලද විකුණුම් හස්ත ක්‍රමයට පද්ධතියට ඇතුළත් කර තිබූ අතර එහිදී ඒ ඒ මධ්‍යස්ථානවල විකුණුම් හා පද්ධතියේ සටහන් වූ විකුණුම් අතර වෙනසක් පැවතුණි. එම වෙනස වූ රු.188,361,518 විකුණුම් ලෙස පද්ධතියට ඇතුළත් කර තිබුණ ද ඊට අදාළ මූලාශ්‍ර ලියවිලි විගණනයට ඉදිරිපත් නොවුණි.	2025 වර්ෂයේ සිට මෙවැනි ආකාරයේ ගැළපීම් සිදු කරන විට එම තොරතුරු ලබා දීමට කටයුතු කරනු ලැබේ.	පද්ධතියේ ඇතුළත් විකුණුම් වටිනාකම හා සත්‍ය විකුණුම් වටිනාකම අතර වෙනස සසඳා නිවැරදි කරගත යුතුය. සියළුම ගණුදෙනු අදාළ මූලාශ්‍ර ලියවිලි මගින් විගණනයට තහවුරු කළ යුතුය.
(ඉ)	තොග සහ වර්ෂයේ මිලදී ගැනීම් ගැලපීමේදී සමාලෝචිත වර්ෂයට අදාල විකුණුම් පිරිවැය රු.402,421,619 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව එය රු.389,142,013 ක් වූයෙන් රු.13,279,606 ක වෙනසක් පැවතුණු අතර වෙනස සඳහා ගැලපීම් කර නොතිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	විකුණුම් පිරිවැයේ ඇති වෙනස ගලපා නිවැරදි කරගත යුතු අතර තොගය හා මිලදී ගැනීම් නිවැරදිව ගැලපීම් කර විකුණුම් පිරිවැය ගණනය කර මූල්‍ය ප්‍රකාශන වල සටහන් කළ යුතුය.
(ඊ)	සමාලෝචිත වර්ෂයේ දී දරා තිබූ ප්‍රාග්ධන වියදම් එකතු වටිනාකම රු.1,165,600 ක් දේපළ, පිරියත හා උපකරණ යටතේ ප්‍රාග්ධනිත නොකර මෙහෙයුම් වියදම් යටතේ දැක්වීම හේතුවෙන් වර්ෂයේ ශුද්ධ ලාභය හා මුළු වත්කම් සමාන ප්‍රමාණයකින් අඩුවෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේ ගිණුම් වල නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	දේපළ, පිරියත හා උපකරණ යටතේ ප්‍රාග්ධනිත කළ යුතු වියදම නිවැරදිව හඳුනාගෙන ඒ යටතේ ගිණුම්ගත කළ යුතුය.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට රු.6,936,088 ක් වූ වෙළඳ ණයගැති ශේෂය තුළ පැවැති වර්ෂ තුනකට වැඩි රු.1,963,011 ක ණයගැති ශේෂ නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.	මෙම ණයගැති ශේෂ පිළිබඳ සොයාබලා අය කර ගැනීමට කටයුතු කරන අතර එම අයකර ගත නොහැකි ශේෂ සඳහා අඩමාන ණය වෙන් කිරීමට කටයුතු කරනු ලැබේ.	ණයගැති ශේෂ කඩිනමින් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු අතර අයවීම අවිනිශ්චිත ශේෂ නිවැරදිව හඳුනාගෙන බොල්ණය වෙන් කිරීමක් සිදුකළ යුතුය.
(ආ)	කටුබැද්ද ව්‍යාපෘතිය අවසන් වී තිබුණද 2014 – 2018 කාලපරිච්ඡේදය තුළ රාජ්‍ය ආයතන 8 ක් සඳහා විශේෂ ඇණවුම් මත සිදුකළ විකුණුම් වලින් 2024 දෙසැම්බර් 31 දිනට රු.1,182,387 ක මුදලක් මණ්ඩලයට අයවීමට තිබුණි. ඉන් රු.720,474 ක් අයකර ගැනීමට කටයුතු නොකර විශේෂ ප්‍රතිපාදන මත 2018 දෙසැම්බර් 31 දින කපා හැර තිබුණි. ණය ශේෂ අයකර ගැනීමේ ක්‍රියාවලිය මෙන්ම, ණයගැතියන් සම්බන්ධ පසුවිපරම් කිරීමේ ක්‍රියාවලියේද, පවතින මන්දගාමී බව හේතුවෙන් මෙලෙස දීර්ඝකාලීන ණය ශේෂයන් තවදුරටත් අය වීමට පැවති අතර රාජ්‍ය හා පෞද්ගලික ආයතන වලින් අය විය යුතු එකතු වටිනාකම රු.9,578,372 ක් වූ ණයගැති ශේෂ අයකර ගත නොහැකි ණයගැති ශේෂ ලෙස වෙළෙඳ ණයගැති ශේෂයෙන් අඩුකර දිගින් දිගටම ගිණුම්වල දක්වා තිබුණි.	මෙම ණයගැති ශේෂ පිළිබඳ සොයා බලා අයකර ගතහැකි මුදල් අයකර ගැනීමට හා ඉතා පැරණි ශේෂ පිලිබඳව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කර අවසන් තීරණයක් ගැනීමට කටයුතු කරනු ලැබේ.	අයවිය යුතු ණයගැති ශේෂ අය කර ගැනීමට ගතහැකි සෑම ක්‍රියාමාර්ගයක්ම ගැනීමට අප්‍රමාදව පියවර ගත යුතුය.
(ඇ)	ජාතික කෞතුකාගාර භූමියේ ස්ථාපිතකර තිබී 2023 දෙසැම්බර් 31 දින ආපසු භාර දී තිබූ ගොඩනැගිල්ල සංවර්ධනය කිරීම වෙනුවෙන් මණ්ඩලය දරන ලද මුළු වියදම වූ රු.70,864,399 (ක්‍රමක්ෂය කිරීමෙන් පසු) 2025 ඔක්තෝබර් 16 වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	දැනටමත් කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් රු. මිලියන 70.8 සඳහා මණ්ඩලය වෙත රු. මිලියන 7.5 ක් ලබා දීමට හැකි බව ප්‍රකාශ කර ඇති අතර එම මුදල ප්‍රමාණවත් නොමැති බැවින් තවදුරටත් සාකච්ඡා කරමින් පවතී.	මණ්ඩලය වෙත අයවිය යුතු මුදල් අයකර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය.

(ඇ)	ලංකා සළුසල සමාගම සතු ගාල්ල උණවටුන පිහිටි ගොඩනැගිල්ල සහිත ඉඩම මණ්ඩලය වෙත පවරා ගැනීම සඳහා 2012 දෙසැම්බර් 12 දින රු.15,248,575 ක් ගෙවා තිබුණද සළුසල සමාගම විසින් එම දේපළ ශ්‍රී ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත 2023 සැප්තැම්බර් 22 දින අලෙවි කර තිබුණි. මණ්ඩලය විසින් දරන ලද මුදල සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	ලංකා සළුසල සමාගම ලිඛිතව දැනුවත් කර ඇති අතර එම මුදල් නොපමාව ගෙවා අවසන් කරන බවට අමාත්‍යාංශ විගණන කමිටුවේ දී එකඟතාවකට පැමිණ ඇත.	මණ්ඩලය වැය කරන ලද මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඉ)	මිලදී ගැනීම්, පරිපාලන, අලෙවිකරණ හා කටුබැද්ද ව්‍යාපෘතිය යනාදිය සඳහා ලබා දී තිබූ අත්තිකාරම්වලින් 2024 දෙසැම්බර් 31 දිනට නොපියවූ එකතුව රු.10,981,969 ක් වූ අත්තිකාරම් ශේෂ 10 කට අදාළ සාක්ෂි මණ්ඩලය සතුව නොතිබුණි.	මේවා ඉතා පැරණි ගනුදෙනු බැවින් ඉදිරි වර්ෂවලදී සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	ලබා දී ඇති මෙම අත්තිකාරම් වලට අදාළ සාක්ෂි සොයා බලා පියවා ගැනීමට කඩිනමින් පියවර ගත යුතුය. අත්තිකාරම් නොපියවීම සම්බන්ධ වගකිව යුතු නිලධාරීන් වන්නේ නම් ඔවුන්ට එරෙහිව විනයානුකූල පියවර ගත යුතුය.

1.6.2. ගෙවිය යුතු මුදල්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සැපයුම්කරුවන්ගෙන් මිලදී ගත් භාණ්ඩ සඳහා ගෙවිය යුතු 2013 වර්ෂයේ සිට පැවත එන රු.6,939,703 ක ශේෂ 05 ක්, දීර්ඝ කාලයක් තිස්සේ පැවත එන විවිධ සේවාවන් ලබාගැනීම වෙනුවෙන් ගෙවිය යුතු රු.8,538,309 ක ශේෂ 14 ක්, 2011 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ජාතික විගණන කාර්යාලයට ගෙවිය යුතු විගණන ගාස්තු රු.10,029,134 ක් නිරවුල් කිරීමකින් තොරව පැවතුණි.	ගෙවීම් සිදු කර ඇත්ද යන්න පිළිබඳ සොයා බලා මේ සඳහා ගෙවීම් කර ඇත්නම් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	ගෙවිය යුතු ශේෂ තහවුරු කරගෙන කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	2023 මැයි මාසයේ සිට රඳවාගන්නා ලද උපයන විට ගෙවිය යුතු බදු රු.581,352 ක හා 2017 සිට 2021 දක්වා කාලපරිච්ඡේදයට අදාළව නිලධාරී	මෙම රඳවා තබා ගන්නා ලද බදු මුදල් ආයතනික මූල්‍ය තත්ත්වය පදනම් කර ගෙන වාරික වශයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත	ගෙවිය යුතු බදු මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත නොපමාව ප්‍රේෂණය කිරීමට

	ගෙවීම්වලින් රඳවා ගත් රු.1,494,183 ක බදු මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි.	ගෙවීමට කටයුතු කරනු ලැබේ.	කටයුතු කළ යුතුය.
(ඇ)	වර්ෂ ගණනාවක සිට පැවත එන ආදායම් බදු රු.63,173,745 ක් එකතු කළ අගයමත බදු රු.2,728764 ක් ජාතිය ගොඩනැගීමේ බදු රු.25,645,319 ක් හා ආර්ථික සේවා ගාස්තු රු.4,303,359 ක් වශයෙන් නොගෙවූ බදු ශේෂ සමාලෝචිත වර්ෂයේදී ද නිරවුල් කර නොතිබුණි.	මෙම බදු මුදල් මූල්‍ය තත්ත්වය පදනම් කර ගෙන දැනටමත් ගෙවීම් කිරීමට අවශ්‍ය කටයුතු කර ඇත.	ගෙවිය යුතු බදු මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත නොපමාව ප්‍රේෂණය කිරීමට කටයුතු කළ යුතුය.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත	ස්වතක්සේරු පදනම මත මාසිකව බදු මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු වුවත් 2024 වර්ෂයට අදාළ රු.11,320,094 ක බදු මුදල් එසේ ගෙවීමට කටයුතු කර නොතිබුණි.	ඉදිරි ගිණුම්වර්ෂ වලදී මෙම මුදල් නොපමාව ගෙවීමට කටයුතු කරනු ලැබේ.	පනතේ විධිවිධාන ප්‍රකාරව ගෙවිය යුතු බදු මුදල් නියමිත දිනට ගෙවීමට පියවර ගත යුතුය.
(ආ)	2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 9.1(ආ) වගන්තිය මඟින් සංශෝධනය කරන ලද මුදල් රෙගුලාසි 371 (2)	අදාළ කාර්යය නිමකළ විගසම අත්තිකාරම් පියවිය යුතු වුවත් 2021-2024 කාලපරිච්ඡේදය තුල නිලධාරීන් 16 දෙනෙකු විසින් අවස්ථා 41 කදී ලබාගෙන තිබූ රු.1,780,458 ක අත්තිකාරම් මුදල් 2025 ඔක්තෝබර් 10 දින වන විටත් පියවා නොතිබුණි.	මෙම අත්තිකාරම් මුදල් 2025 වර්ෂයේ දී පියවීමට කටයුතු කරනු ලැබේ.	චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව අදාල කාර්යය නිමකළ විගසම අත්තිකාරම් පියවිය යුතු බැවින් ඒ සඳහා අවශ්‍ය පාලන ක්‍රියාවලියක් ස්ථාපිත කර ගත යුතුය. අත්තිකාරම් පියවීම පමා කළ නිලධාරින්ට එරෙහිව අවශ්‍ය පියවර ගත යුතුය.

(ඇ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වා දී ඇති රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි			
(i)	3.2 වගන්තිය	සමාලෝචිත වර්ෂය තුළ දිරිදීමනා ලෙස රු.7,960,888 ක් හා වෛද්‍ය වියදම් ලෙස රු.2,035,580 ක් ගෙවා තිබුණද මේ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි.	අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව ගෙවීම් කිරීමට කටයුතු කර ඇත.	මෙවැනි සුවිශේෂී දීමනා සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමෙන් පසු ගෙවීම් කළ යුතුය.
(ii)	6.6 වගන්තිය	2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මාස 09 ක ප්‍රමාදයක් සහිතව 2025 ඔක්තෝබර් 02 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණු අතර කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2026 මාර්තු 31 දක්වා ඉදිරිපත් කර නොතිබුණි.	ඉදිරි ගිණුම් වර්ෂයේ දී රාජ්‍ය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 6.6 වගන්තිය ප්‍රකාරව කටයුතු කරනු ලැබේ.	චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව නියමිත දිනට ඉදිරිපත් කළ යුතුය.
(ඇ)	2018 සැප්තැම්බර් 18 දිනැති අංක PED 01/2018 දරන භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛයේ 4(C) i	එන්ජින් ධාරිතාවය 3000 CC නොඉක්මවන ද්විත්ව කැබ් රථයක් මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ මාසිකව රු.165,000 ක් (වැට් සහිතව) ගෙවීමේ පදනම මත ලබාගත හැකි වුවද ඊට පටහැනිව 2024 ජනවාරි 02 දිනැති අංක PED/S/SLHB/5/7 දරන ලිපිය මගින් ලබාදුන් රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය මත මසකට රු.350,000 ක මුදලකට CHR කැබ්	ඉදිරිපත් කර ඇති සියලු මිල ගණන් එකී සීමාව ඉක්මවා ඇති බැවින් ඒ පිළිබඳ රේඛීය අමාත්‍යාංශය මගින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව (PED) දැනුවත් කර ලබා දෙන උපදෙස් අනුව කටයුතු කිරීම සුදුසු බවට වූ තාක්ෂණික ඇගයීම් කමිටුවේ හා ප්‍රසම්පාදන කමිටුවේ තීරණය පරිදි කටයුතු කර ඇත.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර ආර්ථිකභාවයෙන් යුතුව වත්කම් මිලදී ගැනීමට කටයුතු කළ යුතුය.

රථයක් කල්බදු ක්‍රමය යටතේ ලබාගෙන තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.25,086,792 ක ලාභයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ලාභය රු.57,120,290 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.32,033,498 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ආදායම රු. 261,641,584 කින් ඉහළ ගොස් තිබුණ ද පරිපාලන වියදම් රු.44,413,104 කින්, විකුණුම් හා බෙදාහැරීමේ වියදම් රු.96,770,600 කින්, මූල්‍ය වියදම් රු. 1,832,284 කින් සහ විකුණුම් පිරිවැය රු.143,315,756 කින්, ඉහළ යෑම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ජ්‍යෙෂ්ඨ නිලධාරිනියන් දෙදෙනෙකු, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ අභිබවා කටයුතු කරමින් ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයට මූල්‍යමය අලාභයක් සිදුකිරිම හේතුවෙන් වැඩතහනමට ලක්කර තිබුණි. එහිදී ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 23 වගන්තිය ප්‍රකාරව විනය බලධාරියා විසින් විනය නියෝගය ලබා නොදීම, පාලක මණ්ඩලයේ නොසැලකිලිමත්කම, අපරික්ෂාකාරි බව හා අවස්ථානුකූලව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම ප්‍රමාද කිරීම නිසා අලාභ අයකරගත නොහැකිව තිබුණු අතර වැඩ තහනමට ලක් වූ එක් නිලධාරිනියකට රු.6,294,099 ක වන්දි ගෙවීමට සිදුව තිබුණි.	අදාල නිලධාරිනියන් දෙදෙනාගේ විධිමත් විනය පරීක්ෂණ වාර්තා මණ්ඩලය වෙත ලැබීමෙන් අනතුරුව ඒවා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. එහෙත් වූදිත නිලධාරීන්ට අදාල විනය නියෝග සම්බන්ධයෙන් අවසානාත්මක තීරණ ගෙන නොමැති බව අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අනුව නිරීක්ෂණය වෙයි. ඉදිරියේදී මෙවැනි ආකාරයේ අතපසුවීම් මගහරවා ගැනීමට කටයුතු කරනු ලැබේ.	මණ්ඩලයට සිදු වූ මූල්‍යමය අලාභ අය කර ගැනීමට කටයුතු නොකල අධ්‍යක්ෂ මණ්ඩලයට හා නිලධාරීන්ට එරෙහිව පියවර ගත යුතු අතර සිදුවූ අලාභය අයකර ගැනීමටද පියවර ගත යුතුය.
(ආ)	භෞතික තොග සත්‍යාපනයේදී හඳුනා ගන්නා ලද ඉකුත් වර්ෂයේ සිට පැවත එන රු.6,687,842ක තොග ඌනතාවයන් සඳහා වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන ඔවුන්ගෙන් අයකර ගැනීමට	මේ පිළිබඳව විස්තරාත්මකව සොයා බැලීම සඳහා සුදුසු මණ්ඩලයක් පත්කිරීමට නියමිතව ඇති අතර එම මණ්ඩලය විසින් ලබාදෙන නිර්දේශ අනුව ඉදිරි කටයතු	තොග ඌණතාවයන් සම්බන්ධව වගකිව යුතු පාර්ශව හඳුනාගෙන ඔවුන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ

	කටයුතු නොකර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියකින් තොරව වියදමක් ලෙස සමාලෝචිත වර්ෂයේ අතිරික්තයට එරෙහිව කපා හැර තිබුණි.	සිදුකිරීමට කටයුතු කරනු ලැබේ.	යුතුය.
(ඇ)	මණ්ඩලයේ ERP පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා 2024 ජුලි 12 දින සිට බලාත්මක වන පරිදි හා 2024 ඔක්තෝබර් 15 දින වන විට අවසන් වන පරිදි සමාගමක් සමඟ ගිවිසුම්ගත වී තිබූ අතර ඒ වෙනුවෙන් රු.35,438,690 ක් වැයකර තිබුණ ද 2025 ඔක්තෝබර් මස වන විටත් අදාළ ව්‍යාපෘතිය අවසන් කර නොතිබුණි.	එක එක මොඩියුලය නිම කිරීමට සැලසුම් කර තිබූ අතර ඒ අනුව පාලන අංශයේ වැටුප් කොටස මුලින් නිම කිරීමට කටයුතු කරන ලදී. පසුව අලෙවියට අදාල කොටසද නිමකළ අතර පසුව එක් එක් අංශවලින් සිදුකළ විවිධ සංශෝධන හේතුකොට ගෙන මෙම ගිණුම්කරන පද්ධතිය සම්පූර්ණ කිරීම ප්‍රමාද විය. දැනට පරීක්ෂණ මට්ටමේ පවතී.	ERP පද්ධතිය කඩිනමින් ස්ථාපිත කරගෙන භාවිතා කිරීමට කටයුතු කළ යුතුය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කාරක ප්‍රාග්ධන අවශ්‍යතා වෙනුවෙන් මණ්ඩලය විසින් 2013 වර්ෂයේ දී රු.මිලියන 200 ක ණය මුදලක් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙන් ලබාගෙන තිබූ අතර නියමිත පරිදි ණය ආපසු ගෙවීම පැහැර හැරීම නිසා රු.12,609,761 ක් වූ ගෙවිය යුතු පොලීය නැවත ණය මුදලක් ලෙස ප්‍රාග්ධනිත කර තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මෙම ණය පියවීම සඳහා බැංකුව සමඟ යෝග්‍ය සැලැස්මකට එළඹ නොතිබුණි.	RDB බැංකුව විසින් ලබාගන්නා ලද ණය පියවීම සම්බන්ධයෙන් ඉදිරියේ දී එම ආයතන සමඟ සාකච්ඡා කර වාරික ගෙවීම සම්බන්ධයෙන් මූලික සැලැස්මක් සැකසීමට බලාපොරොත්තු වන අතර ඒ සැලැස්ම අනුව ඉදිරියේ දී කටයුතු කරනු ලැබේ.	බැංකුව සමග සාකච්ඡා කර ණය හා පොලී මුදල් ගෙවීමට සුදුසු වැඩපිළිවෙලක් සකස් කරගෙන ඒ අනුව කටයුතු කළ යුතුය. .
(ආ)	සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.616,196,265 ක් වූ තොග වටිනාකම තුළ රු.93,593,747 ක් වූ වසර ගණනාවක සිට පවතින චලනය නොවන තොග හා අලෙවි කරන ලද තොගයෙන් ඉවත් නොකළ වටිනාකම් පැවතුන ද එකී ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	කමිටුවක් පත්කර ඇති අතර කමිටුවේ තීරණ පරිදි අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. Sala Global Village හා E Commerce තොග 2025 ගිණුම් වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත.	තොග වටිනාකම තුළ අන්තර්ගත අලෙවි කරන ලද තොගයෙන් ඉවත් නොකළ වටිනාකම් ඉවත් කිරීමටත් චලනය නොවන තොග සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ප්‍රකාරව කටයුතු කිරීමටත් පියවර ගත යුතුය.

(ඇ)	දක්ෂිණ අධිවේගී මාර්ගයේ වැලිපැන්න සේවා පරිශ්‍රයේ පිහිටි සමාගමකින් බදු පදනම මත ලබා ගත් ප්‍රදර්ශනාගාරය වසා දමා 2022 දෙසැම්බර් 01 දින නැවත බදුහිමියා වෙත භාර දී තිබුණ ද ගෙවන ලද රු.3,496,857 ක ආපසු ලබා ගත හැකි තැන්පතු මුදල ආපසු ගැනීමට හා 2024 දෙසැම්බර් 31 දිනට ප්‍රදර්ශනාගාරයේ හිඟ බදුකුලිය, විදුලිය සහ ජල ගාස්තුවල වටිනාකම වූ රු.10,500,862 නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.	ඉදිරි වර්ෂයේ දී මේ පිළිබඳ සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	හිඟ බදු කුලිය, ජල හා විදුලිය සඳහා ගාස්තු ගෙවා තැන්පතු මුදල් ආපසු ලබා ගැනීමට කඩිනමින් පියවර ගත යුතුය.

3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කිසිදු මෙහෙයුම් කටයුත්තක් සඳහා උපයෝජනය නොකර 2009 වර්ෂයේ සිට වසා දමා ඇති කෙසෙල්වත්ත ව්‍යාපෘතිය සතු රු.3,988,500 ක් වටිනා යන්ත්‍ර සූත්‍ර හා ගොඩනැගිලි නිශ්කාර්යව පැවතුණු අතර ඒවායේ නඩත්තුව වෙනුවෙන් එකතුව රු.1,077,386 ක් වූ මෙහෙයුම් වියදම් වර්ෂය තුළ දරා තිබුණි.	කෙසෙල්වත්ත ව්‍යාපෘතියට අයත් යන්ත්‍ර උපකරණ නිශ්කාර්යව පැවතුණ ද මෙහි ආරක්ෂාව වෙනුවෙන් ආරක්ෂක නිලධාරීන් යොදවා සිටි අතර විදුලි ගාස්තු සහ ජලගාස්තු ගෙවීම් සිදු කරන ලදී.	අදාල යන්ත්‍රසූත්‍ර ඵලදායිව උපයෝජනය කිරීමට සුදුසු වැඩපිළිවෙලක් සකස් කර ඒ අනුව කටයුතු කිරීමෙන් මෙහෙයුම් වියදම් අවම කරගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	කොටුව අලෙවි ප්‍රදර්ශනාගාර ගොඩනැගිල්ලෙහි වර්ග අඩි 40,830 ක් පමණ වූ පරිශ්‍රය අබලන් වීම හේතුවෙන් දීර්ඝ කාලයක සිට නිශ්කාර්යව පවතින අතර නවීකරණය කර භාවිතා කිරීමට කටයුතු කර නොතිබුණි.	කොටුව ප්‍රදර්ශනාගාර ගොඩනැගිල්ල නවීකරණය කිරීම සඳහා ඉතා විශාල වියදමක් දැරීමට සිදු වන අතර එම වියදම් දැරීමට මණ්ඩලයට නොහැකි බැවින් බාහිර පාර්ශවයන් ඒක රාශීකර PPP ක්‍රමවේදය යටතේ එය නවීකරණය කිරීමට කටයුතු කරනු ලැබේ.	ගොඩනැගිල්ල නවීකරණය කර ඵලදායිව උපයෝජනය කිරීමට සුදුසු වැඩපිළිවෙලක් සකස් කර ඒ අනුව කටයුතු කළ යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂයේ දී අක්‍රීය වූ කෞතුකාගාර ජංගම ගිණුම ඇතුළුව දීර්ඝ කාලයක සිට අක්‍රියව පවතින අනෙකුත් ජංගම ගිණුම් 07 ක එකතු ශේෂය රු.779,173 කට අදාළ ගිණුම් වසා දමා අදාළ මුදල් සුදුසු	මෙම අක්‍රීයව පවතින ජංගම ගිණුම් තුළ ඇති මුදල් ප්‍රධාන ජංගම ගිණුමට මාරු කිරීමට කටයුතු කරන අතර එම ජංගම ගිණුම් ඉදිරියේදී ආරම්භ කිරීමට නියමිත ශාඛා සඳහා	අක්‍රිය බැංකු ගිණුම් වල පවතින ශේෂ ක්‍රියාකාරි ගිණුම් වලට මාරු කරගෙන අදාළ ගිණුම් වසා දැමීමට කටයුතු කළ යුතුය.

කාර්යයන් සඳහා යෙදවීමට අවධානය යොමු කර නොතිබුණි.	ලබා දීමට කටයුතු කරනු ලැබේ.	

3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.3 මාර්ගෝපදේශය ප්‍රකාරව වටිනාකම රු.500,000 ඉක්මවන භාණ්ඩ හෝ සේවා කොන්ත්‍රාත්තු සඳහා විධිමත් ගිවිසුමකට එළඹිය යුතු වුවත් වටිනාකම රු.14,335,375 ක් වූ ආරක්ෂක සේවා කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් 2025 ජුනි 04 දින වන විටත් ගිවිසුමකට එළඹ නොතිබූ අතර එසේ ගිවිසුම්ගත වීමෙන් තොරව 2025 මාර්තු සහ අප්‍රේල් මාස සඳහා රු.2,350,406 ක මුදලක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට ඉදිරියේ දී කටයුතු කරනු ලැබේ.	සේවා ලබා ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ගිවිසුම්ගත වීමට කටයුතු කළ යුතු අතර ගිවිසුම්ගත වීමෙන් තොරව සේවා ලබාගත් හා ගෙවීම් සිදුකළ නිලධාරින්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය.
(ආ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 5.4.8 මාර්ගෝපදේශය ප්‍රකාරව කොන්ත්‍රාත්තුවක් පිරිනැමීමේදී ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් මුදලින් සියයට දහයකට නොඅඩු කාර්යසාධන සුරක්ෂණයක් කාර්යය නිම කිරීමට නියමිත දිනෙන් ඔබ්බට දින 28 ක් දක්වා වලංගු විය යුතු වන පරිදි ලබාගත යුතු වුවත් මිනිස් බල සේවාව ලබාගැනීමට අදාළව තෝරාගත් ආයතනයෙන් කාර්යසාධන සුරක්ෂණය සඳහා ලබාගත යුතු මුදලෙන් රු.897,052 ක් අඩුවෙන් හා කොන්ත්‍රාත් ගිවිසුම අවසන් වන දිනයේදීම අවලංගු වන ලෙස කාර්යයසාධන සුරක්ෂණය ලබාගෙන තිබුණි.	ඉදිරි ප්‍රසම්පාදන කටයුතු වලදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව ගිවිසුම්ගත වීමට පෙර නියමිත පරිදි කාර්යසාධන සුරක්ෂණ ලබා ගැනීමට කටයුතු කළ යුතුය.